## යනවානම් අනේ ...

යනවා නම් අනේ මං අරං
යන තැනකට යන්න රත්තරන් //
හිඟා කකා කොළපතක් අරන්
ලුණුයි බතුයි කමුකො රත්තරන් //

සීත හිමේ කඳු පාමුල
හිංදි සිංදුවක් කිය කිය
හිඟාන ආ ලුණුයි බතුයි කමුකො රත්තරන්
ඊට පස්සෙ දුන්හිඳ ළඟ නටමු රත්තරන්

යනවානම් අනේ ...

සතය සතය එකතු කරල
රහසේ කැටයකට දමල
නුවර එළියෙ ටජ් මහලක් හදමු රත්තරන්
සාරි ඉරල ජනෙල් වලට දමමු රත්තරන්

යනවානම් අනේ ...

*නන්දා මාලනී*